# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2197/22 - 2020 ඔක්තෝබර් මස 15 වැනි බ්‍රහස්පතින්දා - 2020.10.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ජල සම්පාදන අමාත්‍ය, වාසුදේව නානායක්කාර වන මම, එකී මණ්ඩලයට මහගාල්ල ජල සම්පාදන ක්‍රම අදියර III යටතේ ඉදිකරන කුරුදුවත්ත ජල කුළුණට යන ප්‍රවේශ මාර්ගය හා නල එලීම සඳහා ඉඩම් කොටසක පරවශතාව අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ පරවශතා අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

වාසුදේව නානායක්කාර,
ජල සම්පාදන අමාත්‍ය.

2020 ඔක්තෝබර් මස 07 වැනි දින,
ජල සම්පාදන අමාත්‍යාංශය,
"ලක්දිය මැදුර",
35, නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.
යොමු අංකය : 5-2/GL/15



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

ගාල්ල දිස්ත්‍රික්කයේ, අක්මීමන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ, අංක 109A, ඉහළගොඩ නැගෙනහිර ග්‍රාම නිලධාරි වසමේ ඉහළගොඩ - කුරුදුවත්ත ගමේ පිහිටි බුස්සේහේනකන්ද, නොහොත් පොකුණුගොඩවත්ත නමැති ඉඩමෙන් පර්චස් 30ක ප්‍රමාණයෙන් යුත් පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස.

*උතුරට* : රුහුණුගේ මහතා හිමිකම් කියන මෙම ඉඩමේ ඉතිරි කොටස ;
*නැගෙනහිරට* : රුහුණුගේ මහතා හිමිකම් කියන මෙම ඉඩමේ ඉතිරි කොටස ;
*දකුණට* : රුහුණුගේ මහතා හිමිකම් කියන මෙම ඉඩමේ ඉතිරි කොටස ;
*බටහිරට* : රුහුණුගේ මහතා හිමිකම් කියන මෙම ඉඩමේ ඉතිරි කොටස.

ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය : 01. සුගතදාස රුහුණුගේ මහතා,
"දීප්ති",
ගල්වැටවත්ත,
වලහන්දුව

10 - 1120

---

**1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ජල සම්පාදන අමාත්‍ය, වාසුදේව නානායක්කාර වන මම, එකී මණ්ඩලයට රුවන්වැල්ල ජල යෝජනා ක්‍රමයේ තුළුමුව හා පොම්පාගාරය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අවශ්‍යව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපල අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

**වාසුදේව නානායක්කාර,**
ජල සම්පාදන අමාත්‍ය.

2020 ඔක්තෝබර් මස 07 වැනි දින,
ජල සම්පාදන අමාත්‍යාංශය,
"ලක්දිය මැදුර",
35, නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.
යොමු අංකය : 5-2/KE/07

**උපලේඛනය**

කෑගල්ල දිස්ත්‍රික්කයේ, රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 103A, මොරලිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මොරලිය ගමේ පිහිටි - බලයලත් මිනින්දෝරු එල්. සී. කේ. ලියනගේ මහතා විසින් මැන සකස් කරන ලද සැලසුම් අංක WB/R/2015/002 පිහිටි රුවන්වැල්ලවත්ත ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 30.7ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස.

*උතුරට* : ප්‍රාදේශීය සභා පාර හා මෙම ඉඩමේ ඉතිරි කොටස ;
*නැගෙනහිරට* : මෙම ඉඩමේම ඉතිරි කොටස සහ කැළණි ගඟ ;
*දකුණට* : කැළණි ගඟ හා ඇල ;
*බටහිරට* : ඇල හා ප්‍රාදේශීය සභා පාර.

ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය : මල්වත්ත වැලි වැව්ලි සමාගම,
අංක 280, ඩැම් වීදිය,
කොළඹ 12.

10 - 1121

## 1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත

### 92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ජල සම්පාදන අමාත්‍ය, වාසුදේව නානායක්කාර වන මම, එකී මණ්ඩලයට උණවටුන අපජල කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ අංක 22 දරන පොම්පාගාරය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍යව් ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපල අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

**වාසුදේව නානායක්කාර,**
ජල සම්පාදන අමාත්‍ය.

2020 ඔක්තෝබර් මස 07 වැනි දින,
ජල සම්පාදන අමාත්‍යාංශය,
"ලක්දිය මැදුර",
35, නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.
යොමු අංකය : 5-2/GL/19

**උපලේඛනය**

ගාල්ල දිස්ත්‍රික්කයේ, හබරාදුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 1487 හීනටිගල දකුණ ග්‍රාම නිලධාරි වසමේ හීනටිගල දකුණ ගමේ පිහිටි ප්‍රැන්ගි ට්‍රි හෝටලය හිමිකම් කියන ඉඩමෙන් පර්චස් 20ක් පමණ පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස.

| | | |
|---|---|---|
| *උතුරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *නැගෙනහිරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *දකුණට* | : | වාරිමාර්ග දෙපාර්තමේන්තු ඉඩම ; |
| *බටහිරට* | : | මුහුදු වෙරළ දෙසට දිවෙන බොරළු පාර. |

ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය : එඩ්වඩ් ජයකොඩි මිය,
එඩ්වර්ඩ් කලෙක්ෂන්,
රේල්වේ ඇවනිව් - නුගේගොඩ.

10 - 1122

---

**ශුද්ධි පත්‍රය**

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියට අනුව නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යවරයා විසින් 2018.03.21 දිනැති හා අංක 2063/26 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 2A පිටුවේ අංක 04 -196 යටතේ පළ කරන ලද නිවේදනයේ උපලේඛනයෙහි ඉඩම පිහිටි ග්‍රාම නිලධාරි වසම අංක 525 B උඩහමුල්ල - බටහිර ලෙස සඳහන් වුවත් එය අංක 527සී පතිරගොඩ ලෙස නිවැරදි විය යුතු බව 1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ජල සම්පාදන අමාත්‍ය වාසුදේව නානායක්කාර වන මම මෙයින් ප්‍රකාරයට පත් කරමි.

**වාසුදේව නානායක්කාර,**
ජල සම්පාදන අමාත්‍ය.

2020 ඔක්තෝබර් මස 07 වැනි දින,
ජල සම්පාදන අමාත්‍යාංශය,
"ලක්දිය මැදුර",
35, නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.
යොමු අංකය : 5/2/2/1305

10 - 1123

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.